## ඇත්ත කෙටි කතාව

# කොන්ක්‍රීට් ලැල්ලේ සිද්ධිය මෙසේය



මගේ පියා ආරම්භ කළ ඡායාරූප සංගමයෙන් ලංකාවේ බොහෝ ප්‍රදේශවල විනෝද චාරිකා යෑම එකල සිරිතක්ව තිබුණා. අවුරුද්දකට දෙතුන් වතාවක් බස් එකක් ලෑස්ති කරගෙන කෙරෙන ඒ ගමන් හරිම සුන්දරයි. විනෝදජනකයි. සංගමයේ හිටි සාමාජිකයන්ගෙ අපේ වයසෙම දූලා පුතාලත් සහභාගි වුණ නිසා අපි ඒ ගමන් යන්න දත මැද මැද ඉන්නෙ.

මේ එක් චාරිකාවක අදහස වුනේ මීගමු වෙරළට ගිහිල්ලා දවසක් එතැන ගතකරලා ඡායාරූප ගැනීම. එතැන දී එළිමහන් ඡායාරූප ගන්නා ආකාරය කියාදෙන පන්තිත් පැවැත්වුණා. ඉතින් සුපුරුදු පරිදි වාර්ෂික මීගමු චාරිකාව යන්න බස් එක ලෑස්තිවෙලා අපි ඒ කාලෙ ජීවත්වුණු මරදානෙ පොලිස් නිවාසවලින් පිටත්වුණා. මට මතක හැටියට මේ 1968 අවුරුද්ද. ගෙදරින් උදේට කාලා ආවත් පෑලියගොඩ පැන්න ගමන් මීගමු පාරෙම තියන හෝටලයක් ළඟ නතර කරලා පැනි ආප්ප, වන්ඩු ආප්ප හැලප වගේ දේවල් කාලා ප්ලේන් ටී බීම පුරුද්දක් වශයෙන් කෙරුණා. දවල්ට කෑම බොහෝ විට ලැබුණෙ ඒ කාලෙ මීගමුවෙ හිටපු විශිෂ්ඨ ඡායාරූප ශිල්පියෙක් වූ දොස්තර වීර කෝන් මහත්තයලගෙ ගෙදරින්.

ඉතින් ඔහොම දවල්ටත් කාලා, හවස-වෙනකොට මීගමු වෙරළෙ ක්‍රිකට් මැච් එකකුත් ගහලා, කරුවල වැටුණම තමයි කොළඹ පැත්තට හැරෙන්නෙ.

ඉතින් මේ කියන දවසෙ අපිත් එක්ක ගිය කට්ටිය අතරෙ කවුරුත් දන්න දක්ෂ පුවත්පත් කලාවේදියෙකුත් හිටියා. ඔහුත් ඡායාරූප සංගමයේ සාමාජිකයෙක්. ඔහු එකල රජයේ ලොකු තනතුරකුත් දැරුවා. චාරිකාවට ගිහිල්ලා හිටි අනෙක් අය කමීස ටීෂර්ට් වගේ ඇඳලා හිටියත් මෙයා හිටියෙ හොඳ සූට් එකක් ගහලා. පාට, ලා ක්‍රීම් පාට. කීප දෙනෙක්ම එයාගෙ ඇඳුම දිහා බලලා ඇස් උඩ යවනවත් පෙනුණා. කොහොම හරි එයත් අපි එක්ක සිංදු කිය කිය හොඳට විනෝදවෙවී මීගමු ගියා.

ඉතින් එදා දවසෙ වැඩ ඉවරවෙලා, බස් එකට නැගලා, ගැණලා බැලුවමයි පෙනුණෙ එක් කෙනෙක් අඩු බව. ඒ අර සූට් එකෙන් සැරසිලා හිටි එක්කෙනා. එයා දැන් එයි, දැන් එයි කියලා බලං හිටියා. එන පාටක් නෑ. කරුවලත් වැටීගෙන එනවා. බස් එකට නැගලා හිටපු කීප දෙනෙක් බැහැලා ගියා මෑන්ව හොයන්න. හැම තැනම බලලා නැහැයි කියලා ආවා. කවුරුත් දැන් මොනවා කරන්නද කියලා හිත හිත ඉන්නවා. සමහරු යෝජනා කළා අපි යං යන්න කියලා. තාත්තා කිව්වා එහෙම බෑ... අපි තව ටිකක් ඉදිමුකො....

කියලා. විනාඩි විස්සක් විතර යන කොට මෙන්න බොලේ අරයා ආවා.

කිසි කතාවක් බහක් නැතුව කෙලින්ම බස් එකට නැගලා, ඩ්‍රයිවර් මහත්තෙයා ළඟම අනික් සීට් එකේ ඉඳගත්තා. දැන් හරි. කවුරුත් නැගලා නේ. බස් එක කොළඹ බලා පිටත් වුණා.

පිටිපස්සෙ හිටි අපේ තාත්තා ඉස්සර හට ඇවිත් අර යාළුවට කතාකළා, මොකද වුණේ කියලා අහන්න. මෑන් නෙවෙයි කතාකරනවා තියා, තාත්තා දිහා හැරිලවත් බැලුවෙ. ඉස්සරහ බලාගෙනම හිටියා.

බස්එක අද්දලා ටිකක් දුර යනකොට අපිට මහා දුර්ගන්ධයක් දැනුණා. හරියට අසූචි ගඳක් වගේ. හැමෝ ම ලේන්සු අරගෙන නහය කට වහගෙන, කටවල් තද කරගෙන නොයෙක් දේවල් කියන්න පටන්ගත්තා. තාත්තා ආපහු ඇවිල්ලා ඉඳගෙන හිටපු තැනම ඉඳගත්තා. එයාගෙ මූණෙ තිබුණෙ ප්‍රශ්නයක්. දැන් සිංදු කියන්නවත් කෙනෙක් කට අරින්නෙ නෑ.


අපේ යාළුවා වෙරළෙ තිබුණු පොඩි කඩේකින් ඉස්සො වඩේ වගයක් කාලා, බඩ අමාරුයි කිය කිය ඉඳලා තියෙනවා. හවස් වෙනකොට වැසිකිළි යන්න ඕන වෙලා, කාගෙද ගෙදරක වත්තක තිබුණු වැසිකිළියකට ඇතුල් වෙලා. ඒක තුනී කොන්ක්‍රීට් ලෑල්ලක් දාපු වළ කක්කුස් සියක්. දැන් නම් ඒ ජාතියෙ ඒවා දකින්නත් නැහැ. මිනිහා මළපහ කර කර ඉන්න-කෙටෙ අර දිරච්ච කොන්ක්‍රීට් ලෑල්ල කැඩිලා වළ ඇතුලට වැටිලා.

ඉතින් ළඟ පාත කවුරුවත් ඉඳලා නැහැ. අපේ යාළුවා වළේ ඉඳන් හුඟ වෙලාවක් කෑගහන කොට කීප දෙනෙකුට ඇහිලා දුවගෙන ඇවිත් අතදාලා මිනිහ ගොඩට අරගෙන. අර ක්‍රීම් පාට සූට් එක තනිකරම දුඹුරු පාට වෙලා. ළඟ ළිඳක් ළඟට එක්ක ගිහිං මිනිහව නාවලා, සූට් එකත් සුද්ද කරලා, ආපහු අන්දවලා තමයි එවලා තියෙන්නෙ. ඒත් අර අසූචි ගඳ ලේසියෙන් යන්නෙ නැනේ. ආයෙ කවදාවත් එයා ආවෙ නෑ ඡායාරූප සංගමේ වැඩවලට.

එදායින් පස්සෙ දුර පලාතකට ගියාම උඩ කොන්ක්‍රීට් ලෑල්ලක් දාලා තියන වළ කක්කුස්සියක් දැක්කම මගේ ඇඟ හීතල වෙලා යනවා. මම අඩියට දෙකට ආපහු හැරිලා එනවා.

♦ නීතිඥ අනුර හෑගොඩ London





# 13 නරක ඉලක්කමකි!

13 අංකය මහා මූසල, මුස්පේන්තු, වගතුවක් නොවන, මහා කාලකණ්ණි, භයානක, අසුබ නොම්මරයක් හැටියට බොහෝ දෙනෙකුගේ අප්‍රසාදයට භාජනයවෙලා තියෙන්නෙ අතීතයේ ඉඳලමයි. ඒකෙ පටන් ගැන්ම කොයි කාලෙද කියලා හරියට කියන්න බැරිවුණත් හැම රටකම තිබෙන ජන සමාජවල මේ කියන 13 නේ භීතිය මුල්බැසගෙන තිබෙනවා.

මෙය ඉංග්‍රීසියෙන් හඳුන්වන්නෙ ට්‍රිස්කයිඩකාෆෝබියා (Triskaidekaphobia) යන වචනයෙන්. මෙය මිත්‍යා විශ්වාසයක් පමණක් යයි සමහරු නිකම් කීමට කිව්වත් ඒ අය තුළ පවා 13 ට සෑහෙන බයක්, අප්‍රියාවක් තිබෙන බව අපි දන්නවා.

13 ට කොච්චර බයද කියනවා නම් 13 නොම්මරය ඇති ගෙවල් මිළදී ගන්න හෝ කුළියට ගන්න හෝ බොහෝ අය කැමති නැහැ. ඒනිසා බොහොම පාරවල් වල ඇති ගෘහ අංක අතර දහතුන අංකය නැහැ. අංක 12 තියනවා. ඊළඟට තියෙන්නෙ 14. කෝ 13 ? එහෙම නොම්මරයක් ඒ පාරෙ නැහැ. ගොඩනැගිලිවල 13 වෙනි මහලක් නැහැ අර ගෙවල් වල අංක වගේම. 12 ළඟට තියෙන්නෙ 14 වෙනි මහල (තට්ටුව). 13 ක් නැහැ. විදුලි සෝපානය හෙවත් ලිෆ්ට් එකේ ඇති අංක බලන්න. ඒකෙත් 13 අංකයක් නැහැ. මේක එත අතකට පුදුම සහගතයි.

මාසයක 13 වෙනිදා උපන් අය ගැනත් නොයක් ආකාරයේ කතා හැදිලා තියනවා. සමහරු මේ විදියට විග්‍රහකරනවා.

ඒ අය නාහෙට නාහන අකීකරු අය වෙනවා......ඒ අයට හරියට ජීවිතේ පුරාම හතුරො ඇතිවෙනවා......සමාජ සම්මත යන්ට විරුද්ධව යන කෙනෙක් වෙනවා...... ඒ අය අන් ආශ්‍රයට නොවැටී තනිවම ජීවත්වෙන්න හිතනවා......

13 අසුබ ඉලක්කමක් හැටියට ගණන්ගන්න මුල්වුණු අතීත හේතු සිද්ධීන් කීපයක් මෙහෙමයි.

යේසුස් ක්‍රිස්තුන් වහන්සේට ගෝලයෝ 12 දෙනෙක් හිටියා. අවසාන භෝජන සංග්‍රහයේදි උන්වහන්සේ හමුවන්න ඒ 12 දෙනාම ඇවිත් හිටියා. එතකොට යේසුස් වහන්සෙත් සමග ඔක්කොම ගණන 13 යි. යේසුස් වහන්සේ අංක 1 ට ගත්තම 13 වෙනියට වාඩිවුණේ ජූදාස් ඉස්කාරියොත් කියන ගෝලයා. ඒ ජූදාස් තමයි උන්වහන්සේව රෝමන්වරුන්ට පාවා දුන්නේ. එහි ප්‍රතිඵලයක් හැටියට යේසුස් තුමාව අරගෙන ගිහිං කුරුසෙ ඇණගැහුවා. ඒ පාවාදීම කළ ජූදාස් 13 වෙනියා වුණු නිසා එදා ඉඳලා 13 අසුබ පමණක් නෙවෙයි පාවාදෙන, ද්‍රෝහි, මූසල අංකය බවට පත්වුණා. ඒ අංක 13 එපා වුණු එක කතාවක්.

මේ තව කතාවක්. වරදකාරයෙක් එල්ලලා මැරීමේදි පාවිච්චිකරන තොණ්ඩුව අලුගෝසුවා මරණයට නියම වෙච්ච තැනැත්තාගේ බෙල්ලට දානවා. ඒ එල්ලන කඹය විශේෂ ලණු වර්ගයකින් හදන්නෙ. ඒ තොණ්ඩුවට ගැට 13 ක් දාලා තියෙනවා. අලුගෝසුවා වරදකාරයගෙ බෙල්ලට තොණ්ඩුව දාලා ඒ තැනැත්තා පහතට වැටෙන්න සැළැස්සුවම ඒ මොහොතෙම බෙල්ලෙ ඇටේ කැඩිලා යනවා. මරණයට පත්වෙන්නෙ එත කොටයි. 13 ට එකගැටයක් හරි අඩුවුණොත් බෙල්ල කැඩෙන්නෙ නැහැයිලු. ඒ නිසා ගැට 13 ක් ඒ කඹේ තොණ්ඩුවෙ තිබිය යුතුමය කියල නිර්දේශකරලා තියනවලු. මේ හේතුව නිසා 13 බෙල්ල කැඩෙන අසුබ අංකයක් වුණු බවයි සමහර අයගෙ මතය.

මේ නරක 13 නේ නොම්මරේ ගැන මට මතක් වුණේ මේ දිනවල ලංකාවෙ 13 වෙනි සංශෝධනයක් ගැන කතා කර නවා ඇහෙන නිසා. ද්‍රවිඩ සංධානෙ ඉල්ලනවා උතුර සහ නැගණහිරට ඉඩම් සහ පොලිස් බලතල සමග 13 වෙනි සංශෝධනය දෙන්න කියලා. අපි කාටත් මතකයි කාලෙකට ඉස්සර උතුරු නැගණහිර මහ ඇමති පෙරුමාල්ට පොලිස් බලතල දුන්නම එහේ සිවිල් බලකායක් හැදුවා වෙනම පාලන යක් ගෙනියන්න. අපේ රටේ වර්තමාන නායකයන්ට දැන් ඒවා මතක නැතිවෙච්ච හැඩයි. ද්‍රවිඩ සංධානෙ හදන්නෙ ප්‍රභාකරන් මැරිච්ච තැන ඉඳලා වැඩේ ආයිත් පටන්ගන්න. 13 කියන්නේ අලුගෝසුවා බෙල්ලට දාන තොණ්ඩුව. ඒකෙ ගැට 13 ක් තියන බව ඉහතින් පැහැදිලි කළා නේ. ඒක දාගන්නද මේ හදන්නෙ?

♦ වෙලේගෙදර රාළ London



## Soldier of the SL Army marries ex-LTTE girl

Sri Lanka Army soldier E.M.D. Sandaruwan married Chandrasekaran Sharmila, an Ex - LTTE cadre girl on Friday, 27 January.

The wedding took place at the Kilinochchi Central College. Sharmila was among over 11000 ex LTTE cadres rehabilitated by the government of Sri Lanka after defeating the internationally banned terrorist group in May 2009.

The picture shows the couple cutting the cake flanked by their parents.

# හමුදා සෙබලා LTTE සෙබලියක හා විවාහවෙයි

ශ්‍රීලංකා යුද හමුදාවේ සෙබලෙකු පසුගියදා එල්ටීටීඊ කොටි හමුදාවේ හිටපු සෙබළියක හා විවාහවූයේය. සෙබලා ගජබා රෙජමේන්තුවේ සේවය කරන ඊ. එම්. ඩී. සඳරුවන්ය. ඔහුගේ ගම ගල්ගමුවය. මනාලිය 18 වියැති චන්ද්‍රසේකරන් ශර්මිලා ය. ඇය ගේ උපන් ගම කිලිනොච්චියේ භාරතීපුරම්ය. ඇය ළමා සෙබළියක ලෙස කොටි හමුදාවට බැඳී යුද්ධයේදී සටනේ සිටි අතර හමුදා අත් අඩංගුවට පත්වූ පසු පුනරුත්ථාපන කඳවුරක දී පුනරුත්ථාපනය ලැබුවා ය.

මෙම විවාහය සිදුවූයේ ගියමස, එනම් ජනවාරි 27 වන දින කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලයේදී ය. මෙහිදී ශර්මිලා සාමාන්‍ය දෙමළ මනාලියකගේ විලාසිතාවෙන් සැරසී සිටි අතර, සඳරුවන් යුරෝපීය ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියේ ය.

මෙය දශක තුනක් පුරා පැවති යුද්ධයෙන් පසු සිදුවූ විශේෂ සිදුවීමක් වන අතර මේ පින්තූරයෙන් දැක්වෙන්නේ ශර්මිලා සහ සඳරුවන් මංගල කේක් ගෙඩිය කපද්දී දෙදෙනාගේම දෙමාපියන් දෙපසින් සිට බලා සිටින අන්දමයි.

එල්ටීටීඊ යට බැඳී සිටි දෙමළ තරුණ තරුණියන් 11,000 ක් යුද්ධය අවසාන වීමෙන් පසු ශ්‍රීලංකා රජයේ හමුදාවන් යටතට පත්වූ අතර ඔවුහු රජය පිහිටවූ විශේෂ කඳවුරු මගින් පුනරුත්ථාපනය කරනු ලැබ දැන් සාමාන්‍ය පුරවැසියන් ලෙස ජීවිත ගෙවති.